# යුරෝපා ඉතිහාසය

## 1.1 නූතන යූරෝපය උදා වූ ආකාරය පැහැදිලි කරයි.



නිපුණතාව – 12.1 විවිධ බලවේග මුල් කොට ගනිමින් ශිෂ්ටාචාර ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි.

නිපුණතා මට්ටම - 12.1.1 නූතන යුරෝපය උදා වූ ආකාරය පැහැදිලි කරයි.

ඉගෙනුම් ඵල –

- යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම විග්‍රහ කරයි.
- නූතන යුරෝපා ශිෂ්ටාචාරය හැඩගැස්වීමට ග්‍රීක රෝම ක්‍රිස්තියානි ඉස්ලාම් ශිෂ්ටාචාරය බලපෑ ආකාරය පෙන්වා දෙයි.
- ග්‍රීක රෝම ක්‍රිස්තියානි හා ඉස්ලාම් ශිෂ්ටාචාර ව්‍යාප්තිය සිතියමක ලකුණු කරයි.
- නූතන යුරෝපයේ ආරම්භයට තුඩු දුන් හේතු පැහැදිලි කරයි.

මෙම පාඩම අධ්‍යයනයෙන් පහත විෂය කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගත හැකි ය.

- ග්‍රීක ශිෂ්ටාචාරය යනු කුමක් ද?
- ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ
    - පාලන කටයුතු
    - පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ
    - ආර්ථික කටයුතු
    - අධ්‍යාපනය
    - දාර්ශනික චින්තනය හා විද්‍යාව
    - ආගමික විශ්වාස
    - ක්‍රීඩා කටයුතු
    - කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය
    - මූර්ති කලාව
    - සාහිත්‍ය කලාව

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# නූතන යුරෝපා ශිෂ්ටාචාරයේ පදනම

යුරෝපා ශිෂ්ටාචාරයේ මූලය යුරෝපයේ මධ්‍යධරණී ප්‍රදේශවලින් ආරම්භ වී ඇති බව කිව හැකි ය. යුරෝපා ශිෂ්ටාචාරය පෝෂණය කිරිමෙහිලා
ග්‍රීක
රෝම
ක්‍රිස්තියානි
ඉස්ලාම් ශිෂ්ටාචාරයන් ද දායක වී ඇත.

**ශිෂ්ටාචාරයක් යනු**
නගර කේන්ද්‍ර කොටගෙන බිහි වෙන, සැලකිය යුතු තරමේ විශාල ප්‍රමාණයක ජනගහනයකින් සමන්විත පද්ධතියකි.

## ග්‍රීක ශිෂ්ටාචාරය

පැරණි ශිෂ්ටාචාර අතුරින් නූතන ශිෂ්ටාචාරයන්ට සැලකිය යුතු බලපෑමක් සිදු කළ ශිෂ්ටාචාරයක් ලෙස ග්‍රීක ශිෂ්ටාචාරය වැදගත් වේ. මුහුදක් ආසන්නයේ බිහි වූ ශිෂ්ටාචාරයකි. ලොව බොහෝ ශිෂ්ටාචාර බිහිවීමට ජල පෝෂක ප්‍රදේශ හේතු වි ඇත. නමුත් ග්‍රීක ශිෂ්ටාචාරය බිහි වන්නේ මධ්‍යධරණී මුහුදු කලාපය ආසන්නයේ ය. ග්‍රීක ශිෂ්ටාචාරය බිහි වීමට මධ්‍යධරණී මුහුද විශේෂිත බලපෑමක් කොට ඇත.


## ග්‍රීසියේ භූගෝලිය පිහිටීම

යුරෝපා මහාද්වීපයේ ගිනිකොණ දෙසින් පිහිටා ඇත. ග්‍රීසිය සුළු ආසියාවෙන් වෙන් වන්නේ ඊජියන් මුහුදෙනි. ප්‍රධාන අර්ධද්වීපය තුන් පැත්තෙන් ම දිවයින් රාශියක් පිහිටා ඇත. ඉන් ප්‍රධානතම දිවයින වන්නේ ක්‍රීට් දිවයින යි. ග්‍රීසිය මහාද්වීප තුනකින් මායිම් වි ඇත. යුරෝපය ආසියාව හා අප්‍රිකාව ඒ මහාද්වීප තුනයි. මධ්‍යධරණී මුහුද ද ග්‍රීක ශිෂ්ටාචාරය ගොඩනැගීම කෙරෙහි සුවිශේෂී බලපෑමක් කරනු ලැබී ය.ග්‍රීසිය මධ්‍යධරණී මුහුදට මුහුණලා ඇති ගොඩ බිම් ප්‍රදේශය කඩතොළු සහිත වෙරළකින් යුක්ත ය. මෙම පිහිටීම පසු කලෙක ග්‍රීක ශිෂ්ටාචාරය වෙළෙඳාම අතින් දියුණු වීමටත්, ප්‍රදේශ අතර අදහස් හුවමාරු වීමටත් පහසුකමක් ඇති කරන ලදී. පසු කලක ග්‍රීක ශිෂ්ටාචාරය වෙළඳාම අතින් දියුණු වීමට ද මෙම පිහිටීම හේතුවක් විය. මධ්‍යධරණී මුහුදට නැගෙනහිර කෙළවරේ බෝල්කන් අර්ධද්වීපය පිහිටා ඇත. ඊජියන් මුහුද නිසා එය සුළු ආසියාවෙන් වෙන්ව පිහිටා ඇත.බෝල්කන් අර්ධද්වීපයේ දකුණු තුඩුව, ග්‍රීසියට අයත් ප්‍රධාන ගොඩබිම සැකසුණු කුඩා අර්ධද්වීපය හා දූපත් සමූහයකින් සැකසී ඇත. මෙම දූපත් එකිනෙකින් වෙන්ව එහෙත් එකිනෙකට සමීපව පිහිටා ඇත.

මේ නිසා ම දූපත් අතර සම්බන්ධතාවට පහසුවක් විය. ග්‍රීසියේ මෙම භූගෝලිය පිහිටිම,
* නව අදහසක් ව්‍යාප්ත වීමට
* වෙනත් ප්‍රදේශ හා සබඳතා පැවැත්වීමටත්
* වෙළෙඳාම ආර්ථිකයේ වැදගත් තැනක් ගැනිමටත් හේතු වුවා යැයි කිව හැකි ය.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරික්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk




- ග්‍රීසියේ අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ
  - ශේෂ කඳුවලින් සමන්විත වීම.
  - කඳු මගින් වෙන් වූ ක්ෂුද්‍ර භූගෝලීය කලාප
  - කඳුවලින් වට වූ කුඩා භූමි ප්‍රදේශ
  - සාරවත් පස
  - සෞම්‍ය මධ්‍යධරණී දේශගුණය

මෙම අභ්‍යන්තර භූගෝලීය ලක්ෂණ ජනවාස ව්‍යාප්ත වීමට පදනමක් විය.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ග්‍රීසිය ජනාවාස වීම

## මිනෝවානු ශිෂ්ටාචාරය



මිනෝවන් ශිෂ්ටාචාරයට අයත් ගොඩනැගිල්ලක්

ක්‍රි.පූ.3000කට පෙර ග්‍රීසියේ ශිෂ්ටාචාරයක් පැවැති බව කියවේ. එම ශිෂ්ටාචාරය මිනෝවානු ලෙස හඳුන්වයි. ක්‍රීට ශිෂ්ටාචාරය ඊජියන් ශිෂ්ටාචාරය ලෙස ද හඳුන්වයි. ඊජියන්වරු ආදි ග්‍රීක මුතුන් මිත්තන්ගෙන් පැවැත එන්නන් වශයෙන් සැලකේ. ඔවුන් දක්ෂ වෙළෙන්දන් වශයෙන් හඳුන්වයි. ඔවුන් අධිරාජ්‍යක් ද ගොඩනැගූ අතර ග්‍රීසිය, ඊජියන් දිවයින සහ සුළු ආසියාව යන ප්‍රදේශවල නගර ඉදි කළහ. සුළු ආසියාවේ ඔවුන්ගේ ප්‍රධාන නගරය ට්‍රෝයි ය. ක්‍රි.පූ.2500 ක්‍රි.පූ.1400 අතර කාලයේ මෙම ශිෂ්ටාචාරය දියුණුව පැවැතුණි. එහි අගනගරය ක්නොසස් විය. පසු කලෙක මෙම මිනෝවානු ශිෂ්ටාචාරය පරිහානියට පත් විය. තේර දිවයිනේ සිදු වූ ගිනි කඳු පිපිරීම ශිෂ්ටාචාරය පිරිහී යාමට හේතුවක් වන්නට ඇතැ යි සැලකේ.

## මයිසිනියානු ශිෂ්ටාචාරය

මයිසිනියානු ශිෂ්ටාචාරය යුරෝපය තුළ බිහි වූ පැරණිතම ශිෂ්ටාචාරයකි. අවුරුදු 400ක් පමණ මෙම ශිෂ්ටාචාරය පැවති බවට සාධක ඇත. මයිසිනියානුවරු එක් ප්‍රදේශයකට පමණක් සීමා නොවී සමස්ත ග්‍රීක ප්‍රදේශය පුරා ම ව්‍යාප්ත විය. ක්‍රි.පූ. 1600-1100 අතර කාලයේ දී ග්‍රීක දේශයේ බලවත් ම කණ්ඩායම වූයේ මයිසිනිවරු ය. ඔවුන් රණකාමීන් ලෙස ද ප්‍රසිද්ධ ය. ඔවුහු දකුණු ග්‍රීසියෙහි බලකොටු නගර ඉදි කළහ. ඒ නිසා රට තුළ ශක්ති සම්පන්න ආරක්ෂක මධ්‍යස්ථාන බිහි විය. ඔවුන් ව්‍යාප්තවාදී ප්‍රතිපත්තියක් ද අනුගමනය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස නැගෙනහිර මධ්‍යධරණී ප්‍රදේශය ආක්‍රමණය කොට සම්පත් මංකොල්ල කෑම ද සිදු විය. ඔවුන් ක්‍රීටය ආක්‍රමණය කොට මිනොවරුන් යටත් කර ගත්හ.



මයිසිනියානු ශිෂ්ටාචාරය

මෙම ගෝත්‍ර දෙවර්ගය සම්මිශ්‍රණය වීම වඩාත් වාසිදායක විය. එනිසා ම යහපත් ශිෂ්ටාචාරමය ලක්ෂණ සුසංයෝගයක් ඇති විය. මිනෝවරුන් මෙන් ම මයිසිනියානුවරු ද උසස් සාක්ෂරතාවකින් යුක්ත පිරිසක් විය. ක්‍රි.පූ. 1150 දී මයිසිනියානු ශිෂ්ටාචාරය ද බිඳ වැටී ගිය අතර ඉන් පසු ග්‍රීසියේ අඳුරු යුගයක් උදා විය. තවත් වසර 150 කට පමණ පසු ඩෝරියන් ග්‍රීකයන් යටතේ ග්‍රීක ප්‍රදේශවල නව ශිෂ්ටාචාරයක් ආරම්භ විය. පෙර පැවැති ශිෂ්ටාචාරවලින් ද පෝෂණය ලබා වර්ධනය වූ මෙම ශිෂ්ටාචාරය ග්‍රීක ශිෂ්ටාචාරය ලෙස හඳුන්වයි. යුරෝපා ශිෂ්ටාචාරයට ද පදනම වන්නේ ක්‍රි.පූ. 1000 දී පමණ සිට වර්ධනය වූ මෙම ග්‍රීක ශිෂ්ටාචාරය යි.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# ග්‍රීක ශිෂ්ටාචාරයේ ප්‍රධාන ලක්ෂණ

**පාලන කටයුතු**

වාර්තාගත නැතහොත් ග්‍රීක ලිඛිත ඉතිහාසය ආරම්භ වන්නේ ක්‍රි.පූ. 750 දී පමණ ය . මෙම කාලය වන විට ග්‍රීසිය ප්‍රධාන පෞර රාජ්‍ය 9 කට බෙදී තිබුණි. ඒ සෑම පෞර රාජ්‍යක් ම ඔවුන්ට ම ආවේණික කෘෂි ඉඩම් ප්‍රමාණයකින් ද යුක්ත දේශපාලන ඒකකයක් ලෙස නිර්මාණය වී තිබුණි. මෙම දේශපාලන ඒකකයක් වර්තමාන ලෝකයේ දක්නට ඇති ජාතික රාජ්‍ය හා සමානව සම්පූර්ණයෙන් ම ස්වාධීනව පැවැති බව කියනු ලැබේ. ග්‍රීසියට සංක්‍රමණය වූ මුල් ජනපද වාසීන් පළමුව ගම් පිහිටුවා ගනු ලැබී ය. එම ගම් පසු කාලීනව නගර බවට පත් විය. පසුව එම නගර මුල් කරගෙන ග්‍රීක ශිෂ්ටාචාරයේ පෞර රාජ්‍ය ක්‍රමය බිහි විය. පෞර රාජ්‍ය පිළිබඳව වඩාත් පැහැදිලි සාක්ෂි තොරතුරු ලැබෙන්නේ ග්‍රීක ශිෂ්ටාචාරයෙනි.

## පෞර රාජ්‍ය බිහි වීම

පෞර රාජ්‍ය වර්ධනයට බලපා ඇත්තේ භූගෝලීය සාධක සහ මුල් ග්‍රීකයන්ගේ ගෝත්‍රික ස්වරූපයයි. ගෝත්‍ර ජන කණ්ඩායම්වල කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ තම ගෝත්‍රයට ඇති ලැදියාව හා පක්ෂපාතිත්වය යි. එය ගෝත්‍රයෙන් වෙන වෙන ම ජීවත් වීමට බලපෑ හේතුවක් විය. එසේ ම එක් එක් ගෝත්‍රයක් විසින් තමාට ම හිමි කඳු වැටියකින් හෝ ගංගාවකින් වෙන්ව තිබූ මිටියාවතක් අයිති කර ගැනීම දක්නට තිබුණි. එම සාධක පෞර රාජ්‍ය බිහි වීමට හා වර්ධනයට බලපා ඇත. මේ නිසා එක් එක් ගෝත්‍රයන් වෙන් වෙන්ව ජීවත් වූ අතර සියලු ම ග්‍රීකයන් එක්සත් කිරීම දුෂ්කර කාර්යක් විය. සෑම පෞර රාජ්‍යක් ම තම ස්වාධීනත්වය ආරක්ෂා කරගත් අතර තම අසල්වාසීන් කෙරෙහි ඊර්ෂ්‍යා සහගත බවක් ඇති කරගෙන ජීවත් විය.


සෑම පෞර රාජ්‍යක් ම තම රාජ්‍ය ප්‍රදේශය මුල් කරගෙන ආණ්ඩුවක් පිහිටවූ අතර එය රජකුගෙන් හා පාලක මණ්ඩලයකින් සමන්විත විය.

ග්‍රීක ශිෂ්ටාචාරයේ පැවති පෞර රාජ්‍ය අතරින් කැපි පෙනුණු පෞර රාජ්‍ය කීපයක් දැක්විය හැකි ය.

- ඇතැන්ස්
- ස්පාටා
- කොරින්ත්
- තේබ්ස්

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk




ඉහත දක්වන ලද පෞර රාජ්‍ය හතර අනෙකුත් පෞර රාජ්‍යන්ට වඩා විශාලත්වයෙන් හා බලයෙන් කැපී පෙනුණි. කෙසේ වෙතත් සියලු ම පෞර රාජ්‍ය වැසියන් තමන් එක ම ගෝත්‍රයකට අයිති බව විශ්වාස කළහ.

ඔවුන් විශ්වාස කළේ "හෙලන්වරු" නැතිනම් "හෙලන්" නැමැත්තාගේ පරම්පාරවට ඔවුන් අයිති බව ය. මෙසේ වෙන් වෙන්ව ජීවත් වූ ග්‍රීකයන් එකමුතු කළ සාධක කීපයක් හඳුනා ගත හැකි ය.

* තමන් එක ම පරම්පරාවකට අයිති බව
* පොදු භාෂාවක් හා සාහිත්‍යයක් පැවතීම
* ආගම
* ඔලිම්පික් ක්‍රීඩාව

## පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ

- **ඉතා කුඩා භූමි වීම**

  පෞර රාජ්‍යකට අයත් භූමිය ඉතා කුඩා විය. ගංගාවකින් හෝ කඳු වැටියකින් වෙන් වූ කුඩා මිටියාවතක පෞර රාජ්‍ය වර්ධනය විය.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **නගර කේන්ද්‍ර කොට ගෙන පාලනය ගොඩනගා තිබීම**

පෞර රාජ්‍ය සම්බන්ධව විශේෂිත ලක්ෂණයක් වන්නේ නගර බිහි වීම යි. විවිධ ගෝත්‍ර ජන කණ්ඩායම් බිහි කළ පෞර රාජ්‍ය තුළ නගර බිහි වීම  දැකිය හැකි ය. බලකොටු නගර ඉදිකිරීම කැපී පෙනේ. මයිසීනියන්වරු ඉදිකරන ලද බලකොටු නගරවලට උදාහරණ කීපයක් දැක්විය හැකි ය.

- ♦ මයිසීනි
- ♦ ටයිරින්ස්
- ♦ පයිලොස්




ක්‍රීටයෝ නිර්මාණය කළ ට්‍රෝයි නගරය ද ඒ අතර වැදගත් ය. එසේ ව්‍යාප්ත වූ තවත් නගරයක් වන සිනෝසියස් නගරයේ ධනවත් අයගේ මහා මැඳුරු දක්නට තිබුණි. ට්‍රෝයි නගරය විනාශ වීම පදනම් කරගෙන ජනප්‍රවාද වීර කාව්‍ය හා ගද්‍ය සාහිත්‍ය ද නිර්මාණය වී ඇත. පසු කලෙක ඒවා හෝමර්ගේ කාව්‍ය ලෙස එළිදක්වන ලදී. සෙබළුන් අතර මේවා ජනප්‍රිය විය.

e.gov.lk
Copyright

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **ඇතැන්ස් හා ස්පාටා විශාලතම පෞර රාජ්‍ය වීම**

ග්‍රීක පුරවර රාජ්‍ය අතුරින් ඇතැන්ස් හා ස්පාටා විශාලතම පෞර රාජ්‍ය වේ. ග්‍රීක පෞර රාජ්‍ය අතර සුවිශේෂී වූත් ප්‍රබල වූත් රාජ්‍ය වන්නේ ඇතැන්ස් හා ස්පාටා ය. භූගෝලීය ලෙස මෙම පෞර රාජ්‍ය දෙක අනෙකුත් පෞර රාජ්‍යන්ට සමාන වූවත් මෙම නගර දෙක තුළින් ම විද්‍යාමාන වූ ඒවායේ ක්‍රියාකාරිත්වය එකිනෙකට බොහෝ වෙනස් විය. ඒ නිසාම මෙම නගර දෙක අතර තරගකාරීත්වයක් ඇති විය.

| ස්පාටා | ඇතැන්ස් |
|---|---|
| * ඩෝරියන්වරු නිර්මාණය කර ඇත.<br>* සෑම අංශයක් ම හමුදාකරණයට ලක්ව ඇත.<br>* නගරයේ දරුවන්ට හමුදා පුහුණුව ලබා දීම අනිවාර්ය වීම.<br>* නගර වැසියන් යුධ ශිල්පයට දක්ෂ වීම.<br>* නගරය පුරා අඳුරු හමුදා කඳවුරු වර්ධනය වීම. | * ග්‍රීක ශිෂ්ටාචාරයට ආලෝකයක් එක් කළ නගරය.<br>* සංස්කෘතික වර්ධනය.<br>* ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ දක්නට ලැබීම.<br>* පුරවැසියන්ට නිදහසේ ජීවත් වීමේ ඉඩකඩ පැවැතීම.<br>* ආර්ථික කටයුතුවල දී නිදහස ලැබීම.<br>* වාණිජ හා කාර්මික සංවර්ධනය. |



ඇතැන්ස් පෞර රාජ්‍යය

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- **ජනගහනය කොටස් හතරකින් සමන්විත වීම.**

ග්‍රීක ශිෂ්ටාචාරය තුළ ජනගහනය කොටස් හතරකට බෙදා තිබුණි.

(1) පුරවැසියා
(2) ස්ත්‍රීන්
(3) වහලුන්
(4) විදේශිකයන්

රටේ පිරිමි, පුරුවැසියන් ලෙස සැලකූ අතර ඔවුන් රටේ උසස් ම කණ්ඩායම ලෙස පිළිගනු ලැබීය. පුරවැසියන් නොවූ ස්ත්‍රීන්,වහලුන් හා විදේශිකයන් පහත් කොට සලකන ලදී. මේ අයට කිසි ම දේශපාලන අයිතියක් තිබුණේ නැත. සියලු දේශපාලන අයිතිවාසිකම් තිබුණේ පුරවැසියන්ට පමණි. ඔවුන් ප්‍රමාණයෙන් සුළු කණ්ඩායමක් විය. එය ඔවුනට පරම්පාරාවෙන් ම ලැබුණු උරුමයකි. පියාගෙන් පුතාට ලැබුණු විශේෂ වරප්‍රසාදයකි. වහලුන්ට හා විදේශකයන්ට පුරවැසිභාවය ලබා ගත නොහැකි විය.

- **අගනුවර ඇක්‍රෝපොලිස් නමින් හැඳින්වීම හා එය වෙළෙඳ මධ්‍යස්ථානයක් වීම**

පෞර රාජ්‍ය හඳුන්වන ලද්දේ ඇක්‍රෝපොලිස් ලෙස ය. පළාත් පාලන ආයතනය තුළ ඇක්‍රෝපොලිස්වලට වැදගත් ම තැනක් ලැබුණි. පොලිස් යන්නෙහි අදහස යුද්ධ කාලවල දී හෝ වෙනත් හදිසි අවස්ථාවල දේශිය ජනයාට රැකවරණය සැපයූ බලකොටුවක් හෝ එවැනි ස්ථානයකි. ජනගහනය වැඩි වන විට මෙවැනි ස්ථානවලට වාසය සඳහා ජනයා වැඩිපුර පැමිණි අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පසු කලෙක මේවා සක්‍රිය වාණිජ මධ්‍යස්ථාන බවට පරිවර්තනය විය.

- **සෑම පෞර රාජ්‍යකට ම අධිපති දෙවියකු හා දෙවඟන සිටිම:-**

| | | | |
|---|---|---|---|
| උදා: | සියුස් | - | ඔලිම්පියා |
| | ඇතීනා | - | ඇතැන්ස් |
| | ඇපලෝ | - | ඩෙල්ෆි |
| | ඇෆ්‍රඩයිටී | - | කොරින්ත් |

- **ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ අණ්ඩුක්‍රම පැවැතීම**

ආරම්භයේ දී ග්‍රීක පෞර රාජ්‍ය පාලනය කරන ලද්දේ සාමාන්‍ය සුළු රාජ්‍ය ලෙස ය. ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම පැවැති ඇත. මුල් කාලයේ දි ග්‍රීක පෞර රාජ්‍ය පාලනය කළේ ඒකාධිපති ස්වරූපයෙන් ය. පසුකලෙක මෙම ඒකාධිපති පාලනය අවසන් වීමත් සමග බොහෝමයක් ග්‍රීක පෞර රාජ්‍යවලට නව දේශපාලන වර්ධනයක් ළඟා කර ගත හැකි විය.කෙසේ වෙතත් ග්‍රීක ශිෂ්ටාචාරයේ බලගතු ම පෞර රාජ්‍ය දෙක වූ ඇතැන්ස් සහ ස්පාටාවල පැවැති ආණ්ඩුක්‍රම පිළිබඳව අපට අවධානය යොමු කළ හැකි ය.

වර්තමානයේ ප්‍රසිද්ධ දේශපාලන මත වාදයක් වන ප්‍රජතානත්‍රවාදයේ මුල්බිම ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍ය යි. ක්‍රි.පූ. 594 දී ජනප්‍රිය නායකයකු වූ සොලොන් විසින් නව ප්‍රතිසංස්කරණ කීපයක් හඳුන්වා දෙන ලදි. මේ අනුව ඇතැන්ස් සෑම පුරවැසියෙකු ම පෞර රාජ්‍යයේ මහා සභාවෙහි සමාජිකයකු විය. ඍජු ප්‍රජතාන්ත්‍රවාදය සංකල්පය ලොවට හඳුන්වා දෙන ලද්දේ ඇතැන්ස් පෞර රාජ්‍ය විසිනි. ප්‍රජාතන්ත්‍රවාදයට යන ගමනේ පළමු පියවර තබන ලද්දේ ක්‍රි.පූ .621 දී ඩ්‍රැකෝ ය.

තවත් ප්‍රබල පෞර රාජ්‍යක්වූ ස්පාටාවල පැවැතියේ ඒකාධිපති පාලන ක්‍රමයකි. එනම් රාජාණ්ඩු ක්‍රමයයි. ස්පාටා රාජ්‍ය තුළ පරිපාලනය ඇතුළු සෑම අංශයක් ම හමුදාකරණයට ලක්වී තිබුණි.

මේ ආකාරයට ම ග්‍රීක පෞර රාජ්‍යවල ඒ ඒ රාජ්‍යයට ආවේණික වූ පාලන විධි තිබී ඇත.ඇරිස්ටෝටල් කළ පර්යේෂණයකට අනුව ග්‍රීක පෞර රාජ්‍යවල විවිධ ආණ්ඩුක්‍රම වර්ග 250ක් පමණ තිබී ඇත.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආර්ථික කටයුතු



ඔලිව්

එළවළු





ගොවිතැන



මිදි



ධීවර කර්මාන්තය



ග්‍රීසියේ ආර්ථික කටයුතු

මැටි කර්මාන්තය



පතල් කර්මාන්තය



රිදී ලබා ගැනීම

ග්‍රීසියේ ප්‍රධාන ජීවනෝපාය වූයේ කෘෂිකර්මාන්තය යි. මධ්‍යධරණී දේශගුණය යටතේ වගා කළ හැකි බෝග වගා කරන ලදී. ඒ අනුව එළවළු වගාව මිදි වගාව ඔලිව් වගාව සරුවට කරන ලදී. පැවැති සෞම්‍ය දේශගුණය යටතේ එළවළු හා පලතුරු වගාව සාර්ථක කළ හැකි විය. සෑම ප්‍රදේශයක ම එක ම ලෙස වගා කිරීමට නොහැකි විය. සමහර ප්‍රදේශවල පස නිසරු බව වගාවට බාධාවක් විය.

පෞර රාජ්‍ය සියල්ල ම මුහුදෙන් වට වී තිබූ බැවින් ධීවර කර්මාන්තය ද ප්‍රධාන ආර්ථික කටයුත්තක් විය.එසේම විදේශ වෙළෙඳාමට යොමු වීමට ද මෙය හේතුවක් විය.එනම් පෞර රාජ්‍ය සියල්ල ම වාගේ මුහුද සීමාවේ පැවතීම වෙළෙඳාමට යෝග්‍ය විය.

කර්මාන්ත ලෙස මැටි කර්මාන්තය ද, රිදී ලබා ගැනීම ඉලක්ක කරගත් පතල් කර්මාන්තය ද පැවැති බව කිව හැකි ය.වහල් සේවය පැවැති නිසා ශ්‍රමය ලබා ගැනීම ද පහසු විය.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## අධ්‍යාපනය

- ග්‍රීක අධ්‍යාපනය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණයක් වූයේ අධ්‍යාපනය පිරිමි දරුවන්ට හා තරුණයන්ට පමණක් සීමා වීම ය. අධ්‍යාපනය ඉතා කුඩා අවධියේ දී ම ආරම්භ විය. ග්‍රීක අධ්‍යාපනයේ විෂය මාලාවට අන්තර්ගත වූ ප්‍රධාන විෂය කීපයක් හඳුනා ගත හැකි ය.

    ⇒ මලල ක්‍රීඩා
    ⇒ ජිම්නාස්ටික් පුහුණුව
    ⇒ ග්‍රීක මහා පුරුෂයන්ගේ ජීවන කථා
    ⇒ සංගීතය
    ⇒ කාව්‍ය අධ්‍යාපනය

- පාසල් :- පෞද්ගලික පාසල් හා පෞද්ගලික ගුරුවරුන් විසින් අධ්‍යාපනය ලබා දෙන ලදි.
    උදා:- ප්ලේටෝගේ "ඇකඩමි"
    ඇරිස්ටෝටල්ගේ " ලයිසියම් "

- උගත් තරුණයන් අතර බෙහෙවින් ජනප්‍රිය වූ " සොෆියට් වරු" නමින් හැඳින්වූ ගුරුවරු පිරිසක් ද ග්‍රීක අධ්‍යාපන ක්‍රමය තුළ සිට ඇත. ඔවුන් ඉගැන්වූ විෂයයන්

    ⇒ ගණිතය
    ⇒ තාරකා ශාස්ත්‍රය
    ⇒ ව්‍යාකරණ
    ⇒ සාහිත්‍යය
    ⇒ කථිකත්වය

- "ස්පාටා " පෞර රාජ්‍යයේ සියලු ම පිරිමින් යුධ පුහුණුව ලබා ගත යුතු විය. කුඩා කල සිට ම දරුවන්ට හමුදා පුහුණුව ලබා දීම දක්නට තිබුණි. අවුරුදු 07 සිට 20 දක්වා තරුණයන් හමුදා කඳවුරුවල හමුදා පුහුණුව ලබා ගන්නා ලදි. එහිදී ඔවුන් ලැබූ අධ්‍යාපනයේත් හමුදා පුහුණුවෙත් පදනම වූයේ දැඩි විනය යි.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## දාර්ශනික චින්තනය හා විද්‍යාව


ග්‍රීකයන්ගේ පරිකල්පනය භෞතික ලෝකයේ සිදුවීම්වලට පමණක් සීමා නොවි ය.මිනිසාගේ විවිධ හැසිරිම් රටාවලට බලපාන හේතු ,නිවැරදි චර්යාවන් ඇති විමට බලපාන කරුණු, පුද්ගල සබඳතාවල සංකිර්ණතා , රාජ්‍ය හා පුරවැසියන් අතර ඇතිවන සබඳතාවල ස්වභාවය පිළිබඳවද ග්‍රීක දාර්ශනිකයෝ විශ්ලේෂණාත්මක අදහස් ඉදිරිපත් කොට ඇත. විවිධ කරුණු ,මතවාද නිවැරදි දැක්ම හා බැදුණු නිවැරදි ක්‍රියා පිළිබඳ ස්වභාවයන් ක්‍රි.පූ.පස්වන සියවසට පමණක් නොව වර්තමාන සමාජයට ද වටිනා අදහස් ය.

ග්‍රීක අධ්‍යාපන ක්‍රමය තුළ සොපිස්ට්වාදීන් ලෙස ප්‍රචලිත වූ ගුරුවරුන්ගේ ප්‍රධාන කාර්ය වුයේ ද තරුණයන් දේශනා පැවැත්වීමට පුරුදු පුහුණු කිරීම ය. ඔවුන් ස්වාභාවික විද්‍යාව, ආණ්ඩුක්‍රමය, ආචාරධර්ම හා ආගම පිළිබඳව විෂය කේෂේත්‍ර අධ්‍යයනයට තරුණයන් යොමු කරන ලදී.


ග්‍රීකයන් විසින් සියවස් ගණනාවක් වන්දනාමාන කරන ලද දෙවිවරුන්ගේ පැවැත්ම හා ඔවුන් සතු බලය පිළිබඳව සොපිස්ට්වරු ප්‍රශ්න කරන ලද අතර දේශානා ද පැවැත්විය. මේ පිළිබඳව ප්‍රථම වතාවට මතවාද ඉදිරිපත් කළ දාර්ශනික කණ්ඩායම වුයේ සොපිස්ට්වරු ය.

ග්‍රීක ඉතිහාසයේ වැදගත් ම ප්‍රසිද්ධ ම දාර්ශනිකයන් තිදෙනෙකි.


* සොක්‍රටිස්
* ප්ලේටෝ
* ඇරිස්ටෝටල්



ඇරිස්ටෝටල්



ප්ලේටෝ



සොක්‍රටිස්

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සොක්‍රටීස් :- (ක්‍රි.පූ.469-399)

- ග්‍රීක සමාජය තුළ ප්‍රසිද්ධ විය.
- පුරවැසියෙකුට රාජ්‍යය වෙනුවෙන් උසස් ම ලෙස සේවය කළ හැකි වන්නේ වරද හා නිවැරදි බව අතර වෙනස හඳුනා ගැනීමෙන් හා යුක්ති සහගත ලෙස ක්‍රියා කිරීමෙන් බව ඔහු ප්‍රකාශ කරන ලදී.
- ඔහු තම අදහස් ලේඛනගත කළේ නැත.
- පසුකාලීන දාර්ශනිකයන් තම අදහස් දැන්වීමවල දී සොක්‍රටීස්ගේ අදහස් ප්‍රයෝජනයට ගැනීම සිදු විය.
- සොක්‍රටීස්ගේ ශ්‍රේෂ්ඨතම ගෝලයා බවට පත් වූයේ ප්ලේටෝ ය.
- සොක්‍රටීස්ගේ දාර්ශනික අදහස් වර්තමාන දේශපාලන චින්තනය තුළ තවමත් ජීවමානව පවතී.
- ක්‍රි.පූ.5වන සියවසේ දී සොක්‍රටීස් උපන් දේශයේ දී ඔහුගේ දාර්ශනික අදහස්වලට පිළිගැනීමක් නොවී ය.අවසානයේ බලහත්කාරයෙන් වස පොවා සොක්‍රටීස් මරණයට පත් කරන ලදි.

## ප්ලේටෝ(ක්‍රි.පූ.427-347)

- සොක්‍රටීස්ගේ ප්‍රධානතම හා දක්ෂතම ශිෂ්‍යයා වේ.
- ඔහු උපතින් ප්‍රභූ පන්තියට අයත් ය.
- සොක්‍රටීස්ගේ මරණයෙන් පසු ඔහුගේ අදහස් ඉගැන්වීමට නැඹුරු විය.
- ඔහු පොත්පත් රචනා කරන ලද්දේ සංවාද ස්වරූපයෙනි.

**ඔහුගේ දාර්ශනික අදහස්,**

⇒ තෝරා ගත් කණ්ඩායමක් විසින් පාලනය කරනු ලබන යහපත් රාජ්‍ය පිළිබඳව මනඃකල්පිත ආකෘතියක් ඉදිරිපත් කිරීම.
⇒ සාධාරණ ආණ්ඩුවක් පිළිබඳ සංකල්පය
⇒ කීප දෙනෙක් විසින් කරනු ලබන පාලනයක්. ඔවුන් බුද්ධිය හැකියාව හා සාධාරණත්වය පිළිබඳ අදහස් ඇති දාර්ශනිකයන් විය යුතු බව.
⇒ සුදුසු ම පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදය බව
⇒ ප්‍රභූවරුන් විසින් කරනු ලබන පාලනය උසස් බව. මෙහි ප්‍රභූවරයා යනු අදහස් බුද්ධිය හැකියාවලින් උසස් පුද්ගලයන් ය.
⇒ ජනතාව උපතින් ලද ගුණාංගවලට අනුව කටයුතු කළ යුතු බව. උදා:- එඩිතර අය හමුදා සේවකයන් විය යුතු බව, ආහාර ඇඳුම්පැළඳුම් හා ඒ හා සමාන වෙනත් අවශ්‍යතා ගැන උනන්දු වන අය ව්‍යාපාරිකයන් හා කම්කරුවන් විය යුතු බව.

- ඔහු “ඇකඩමි” නමින් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන ගොස් ඇත.
- ඔහු රචනා කරන ලද කෘතිය “ සමූහාණ්ඩුව”නම් විය.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ඇරිස්ටෝටල් (ක්‍රි.පූ.384-322)

ප්ලේටෝගේ දක්ෂතම ශිෂ්‍යයා වේ. විද්‍යාඥයකු හා දාර්ශනිකයකු ලෙස ඔහු ඉතා වැදගත් ය. සොක්‍රටීස්ට හා ප්ලේටෝට වඩා ඔහු සුවිශේෂී වන්නේ යම් යම් විෂය සම්බන්ධ ව දැනුම හැකි තරම් එකතු කොට ක්‍රමවත්ව සංවිධානය කිරීමට හා වර්ගීකරණයට උත්සාහ කිරීම නිසා ය. ඇරිස්ටෝටල්ගේ ක්‍රමවේදය නූතන විද්‍යාත්මක චින්තනයේ වැදගත් සංධිස්ථානයක් විය. ඔහු පොත්පත් ගණනාවක් රචනා කොට ඇත.

ඔහු රචනා කළ කෘතීන් කීපයක්

- දේශපාලනය :- පාලන ක්‍රමයක මූලධර්ම විස්තර කිරීම පෞර රාජ්‍ය 150 ක පාලන ක්‍රමය අධ්‍යයනය කොට ලියා ඇත.
- ආචාරධර්ම :- පුද්ගල ක්‍රියාකාරකම් හා විශ්වාස පරීක්ෂා කොට පුද්ගලයන් තුළ ගුණාංග ඇති වීම කෙරෙහි බලපාන සහ පුද්ගලයාට සතුට ඇති කරන කරුණු මොනවා ද යන්න මෙහි විස්තර කොට ඇත.
- කාව්‍ය ශාස්ත්‍රය :- යහපත් හා අයහපත් ග්‍රීක නාට්‍ය සම්බන්ධයෙන් විශ්ලේෂණ ඉදිරිපත් කොට ඇත.
- තර්ක ශාස්ත්‍රය :- නිවැරදිව තර්ක කිරීමේ මූලධර්ම ඉදිරිපත් කොට ඇත

වැදගත් ග්‍රීක දාර්ශනිකයෝ,

| නම | වැදගත්කම |
|---|---|
| 1.තේලිස්,අනෙක්සිමිනස් , එම්පරඩොල්ස් | පෘථිවිය නිර්මාණය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම |
| 2.සොක්‍රටීස් | ප්‍රශ්නෝත්තර තර්ක ක්‍රමය |
| 3.ප්ලේටෝ | පරමාදර්ශී රාජ්‍ය |
| 4.ඇරිස්ටෝටල් | දේශපාලන විද්‍යාවේ පියා |
| 5.ඇරිස්ටාකස් එරටෝනිතිනිස් හෙරත්ලිටස් } | පෘථිවිය හා ග්‍රහ වස්තූන් පිළිබඳව වැදගත් ගණිතඥයෝ |
| 6.පයිතගරස් | ගණිතඥයෙකි, පයිතගරස් න්‍යාය |
| 7.ආකිමිඩස් | ගණිතය පිළිබඳ සොයාගැනීම්, ප්ලෝත්පීඩන න්‍යාය |
| 8.හිපොක්‍රටීස් | බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා |
| 9.හෙරඩෝටස් | ඉතිහාසයේ පියා |

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ආගමික විශ්වාස

- ග්‍රීක ආගමික විශ්වාස, වන්දනා ක්‍රම හා චාරිත්‍ර විධි හා සම්බන්ධ විය. ග්‍රීකයෝ බහු දේවවාදීහු වූහ.දෙවිවරු ගණනාවක් වන්දනාමාන කළහ. ඒ අතරින් වැදගත් කොට සැලකූ දෙවිවරු කීපදෙනෙක් වූහ.


සියුස්


ඒරස්


ඇතීනා


ඇපලෝ

ග්‍රීක දෙවිවරුන් කිසියම් අනුපිළිවෙළක ආකාරයකට සකස් වී ඇති බව පෙනේ . මෙම දෙවිවරුන් යම් යම් ස්වාභාවික සංසිද්ධි පිළිබඳ බලයක් සහිත වූ බව පිළිගැනේ. ඔවුන් අතර යම් ඥාතිත්වයක් ද පැවැති බව කියනු ලැබේ.

| | |
|---|---|
| සියුස් | අහසට අධිපති දෙවියන් අතර ප්‍රධානියා |
| හෙරානා | සියුස් දෙවියාගේ බිරිඳ |
| ඇතීනා | සියුස් දෙවියන්ගේ දියණිය |
| ඒරස් | යුද්ධයට අධිපති හෙරානාගේ පුත්‍රයා |
| හර්කියුලිස් | ලෝකය උසුලාගෙන සිටින්නා<br>සියුස් දෙවියන්ගේ පුත්‍රයා |
| ඇපලෝ | සූර්ය දෙවියා |
| ප්‍රෝසයිඩන් | සමුද්‍රයට අධිපති |
| ඇෆ්‍රඩයිට් | ආලයට අධිපති |

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

- පුර රාජ්‍යවල අධිපතිවරුන් ලෙස සලකන දෙවිවරු පිරිසක් සිටි බවද කියවේ.
  - ♦ සියුස්-ඔලිම්පියා
  - ♦ ඇතිනා-ඇතැන්ස්
  - ♦ ඇපලෝ- ඩෙල්ෆි
  - ♦ ඇෆ්‍රඩයිට් - කොරින්ත්

ඔලිම්පික් කන්ද පොදුවේ සියලු දෙවිවරුන්ගේ නිවහන සේ විශ්වාස කරන ලදි.දෙවිවරුන් වෙනුවෙන්


* යාඥා කිරීම
* පුද පූජා පැවැත්වීම
* බිලි පූජාවල යෙදීම

සිදු කරන ලද්දේ මෙම කඳු මුදුනේ සිට ය.පසු කලෙක දී දෙවිවරු පිළිබඳ විශ්වාසය වැඩි වන විට දෙවිවරුන් වෙනුවෙන් ඉතා විශාල අලංකාර දෙව්මැඳුර තැනවීමට ද ග්‍රීකවරු උනන්දු වූහ.

## ක්‍රීඩා

ග්‍රීක ශිෂ්ටාචාරයේ ක්‍රීඩාවට විශේෂ තැනක් දී තිබුණි. අදත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ඉහළින් ම සලකන ඔලිම්පික් ක්‍රීඩා ආරම්භ වූයේ ග්‍රීක ශිෂ්ටාචාරයේ ය.ග්‍රීකවරු වන්දනා මාන කළේ එක ම දෙවිවරුන් පිරිසකට ය.අස්වැන්න නෙලා අවසන් වූ පසු එළඹෙන විවේකී කාලයේ දී සියුස් දෙවියන් උදෙසා පවත්වන ලද එළිමහන් ක්‍රීඩා සැනකෙළියක් වූ ඔලිම්පික් ක්‍රීඩාවලට ඔවුන් සහභාගි වූයේ එක ම ජන වර්ගයක් ලෙසිනි.

සියුස් දෙවියන් උදෙසා පවත්වන ආගමික උත්සවයක් ලෙස ඔලිම්පික් උළෙල ග්‍රීකයෝ ආරම්භ කළහ.වසර හතරකට වරක් පවත්වන ලද උත්සවයකි.සියලු ම පුර රාජ්‍යවල ජනයා මෙම උළෙලට සහභාගි විය.එම කාලසීමාව තුළ සියලු ම ගැටුම් නවතා සියලු ම වැසියන් මෙම උළෙලට සම්බන්ධ වීම විශේෂ ලක්ෂණයකි.


මලල ක්‍රීඩා



අශ්වරථ පැදවීම


පංච ප්‍රයාම


මල්ලවපොර


විසි කිරීමේ ඉසව්


පිහිනීම


බර ඉසීලීම

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

මැරතන් තරග ආරම්භය

පර්සියානුවන් හා ග්‍රීකවරු අතර මැරතන් නම් ස්ථානයේ ඇති වූ සටනින් ජයග්‍රහණය ලැබූ ඇතැන්ස් හමුදා නායකයා, ඔහුගේ ජයග්‍රහණය ජනයාට දැනුම් දීමට යැවූ පණිවිඩකරුවකු එම පණිවිඩය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ම මැරතන් නම් ස්ථානයේ දී මරණය ට පත් විය. එම සිද්ධිය සිහිකිරීම පිණිස ඔලිම්පික් උළෙලේ ක්‍රීඩා ඉසව්වක් ලෙස මැරතන් තරගය ආරම්භ කොට ඇත.

## කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

ග්‍රීක ඉතිහාසයේ පෙරික්ලියන් යුගය ගෘහ නිර්මාණ ශිල්පයේ හා කලාවේ ස්වර්ණමය යුගය ලෙස සලකයි. මූර්ති ශිල්පය හා ගෘහ නිර්මාණ ශිල්පය ඒ අතරින් කැපී පෙනේ.ගෘහ නිර්මාණ ශිල්පයේ දී හුණුගල් සහ කිරිගරුඬ භාවිත කොට ඇත.



පාතිනන් දෙව්මැදුර

පාතිනන් දෙව්මැදුර:-

ගෘහ නිර්මාණ ශිල්පයේ කැපී පෙනෙන ගොඩනැගිල්ලකි. අතිශයින්ම සිත්ගන්නාසුලු ලෙස වර්ණවත් පිහන් ගඩොලින් ඉදි කර ඇත. මෙවන් අලංකාර ගොඩනැගිල්ලක් කවර කලකවත් ඉදි කොට නැති තරම් ය. ග්‍රීසියේ සිටි සුප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පියකු වූ ඉකටිනස් විසින් පාතිනන් ගොඩනැගිල්ල ඉදි කොට ඇත. මීට අමතරව තවත් ගොඩනැගිලි හා දේවස්ථාන සමූහයක් ඇතැන්ස් නගරය තුළ ඉදි කොට ඇත.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

<u>ඇතීනා දෙවඟනගේ ප්‍රතිමාව</u>

ඇතැන්ස් නගරයට අධිපති ලෙස සලකන ඇතිනා දෙවඟනගේ ප්‍රතිමාවක් පාතිනන් දෙව්මැඳුර තුළ ඉදි කොට ඇත.ඇතිනා දෙවඟනයේ නැඟී සිටිමේ ඉරියව් විදහා දක්වන ඉතා උසස් ප්‍රතිමාව දේවස්ථානය තුළ ඉතා අලංකාර ලෙස පිහන් ගඩෝලින් ඉදි කර ඇත.



මීට අමතරව ඇත්දත්වලින් හා රනින් නිමකරන ලද ඇතීනා දෙවඟනගේ තවත් ප්‍රතිමා කිපයක් ම දේවස්ථානය තුළ දක්නට ඇත.

- ඇතැන්ස් නගරයේ ඇති ගොඩනැගිලි හා දේවස්ථාන අලංකාර චිත්‍රවලින් නිමවා ඇත.ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පයකු වූ පොලිග්නෝටස් විසින් එම චිත්‍ර නිර්මාණය කර ඇත.

<u>මූර්ති කලාව</u>

මූර්ති කලාවේ කැපී පෙනෙන මූර්ති කිහිපයක් ඇත.

* සියුස් දෙවියන්ගේ ප්‍රතිමාව
* කවපෙත්ත විසි කරන්නා
* බොක්සිං ක්‍රීඩකයා



බොක්සිං ක්‍රීඩකයා



කවපෙත්ත විසි කරන්නා

ශරිරයේ සෑම අංගයක් ම මනාව ඉස්මතු වන සේ මෙම මූර්ති ඉදි කොට ඇති ආකාරය පෙනී යයි. මයිරන්ගේ නිර්මාණයක් වූ කවපෙත්ත විසි කරන්නාගේ මූර්තිය ග්‍රීක මලල ක්‍රීඩකයන්ගේ ජව සම්පන්න භාවයන් තීක්ෂණ දැක්මත් මනාව විදහා දක්වයි. චිත්‍ර ශිල්පයකු වූ ඇපලෝඩෝරස් ආලෝකය හා අඳුර චිත්‍ර ශිල්පයේ දී නිවැරදිව භාවිත කරන ආකාරයත්, යථාර්ථවාදි සිතුවම්කරණය පිළිබඳවත්, නව භාවිත හා ක්‍රමවේදත් හඳුන්වා දෙන ලදි. ග්‍රීක චිත්‍රවල භාවානාත්මක විදහා දැක්විම ඉතා තියුණු විය.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටි.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## සාහිත්‍යය හා කලාව

ග්‍රීක ශිෂ්ටාචාරයේ නාට්‍ය කලාවට ද සුවිශේෂී තැනක් හිමි වේ.නූතන නාට්‍ය කලාව බිහි වීමට ද ඉන් විශාල පිටිවහලක් ලැබුණි. මුල් කාලයේ ග්‍රීසියේ ආගමික උත්සව සඳහා ගීතිකා හා කණ්ඩායම් ගායනා පමණක් උපයෝගි කරගනු ලැබී ය.

### එස්කිලස්

- පෙරික්ලස්ගේ යුගයේ විසූ මහා නාට්‍යකරුවන් අතින් නාට්‍ය පිටපත් විශාල සංඛ්‍යාවක් ලියවී ඇත.

උදා:- එස්කිලස් ග්‍රීක මිත්‍යා ප්‍රබන්ධවල එන දෙවිවරුන් හා වීරයන් පසුබිම් කරගෙන ඛේදාන්ත රචනා කළේ ය. ඔහුගේ නාට්‍යවලට පදනම් වූයේ වැරැදිකරුවන් සඳහා දඬුවම අනිවාර්ය බව, අහංකාර ආසියාතික ආක්‍රමණිකයන්ට අනුකම්පා කිරීම හා ග්‍රීසිය ආරක්ෂා කිරීමට සිටි දෙවියන් වහන්සේ ශක්තිය හා කැමැත්ත යන තේමාය.

### සොපොක්ලිස් (ක්‍රි.පූ 490-406)

- මෙකල සිටි මහා නාට්‍ය කරුවෙකි. ශිල්පීන් දෙදෙනකු පමණක් සිටි පෙර නාට්‍යවල ස්වභාවය වෙනස් කරමින් නළුවන් තිදෙනෙක් ඇතුළත් කරන ලදි. ඔහු විසින් රචිත  නාට්‍ය වන්නේ,
  - ඇන්ටිගනී
  - ඉලෙක්ට්‍රා
  - ඊඩිපස්රෙක්ස්

මෙම නාට්‍ය තුනෙන් ම කියවෙන්නේ අර්බුද අවස්ථාවක දී  හැඟීම් මනාව ප්‍රකාශ වන ආකාරයත් ඒ ඒ පුද්ගලයන්ගේ ක්‍රියා සම්බන්ධව දෙවියන්ගේ බලපෑමත් ය.

### ඇරිස්ටොපේන්ස් (ක්‍රි.පූ 440-380)

- වැදගත් ග්‍රීක නාට්‍යකරුවෙකි. ප්‍රහසන නාට්‍ය කලාව සම්බන්ධ ප්‍රවීණයෙක් විය .මෙම නාට්‍ය රචනා වී ඇත්තේ එදා ග්‍රීක සමාජයේ පැවැති ඇතැම් දේශපාලන ලක්ෂණ හා ග්‍රීකවරුන් ,විවිධ සමාජ තත්ත්ව උපහාසයට ලක් කිරීමේ අරමුණිනි. ඔහු විසින් රචිත නාට්‍ය වන්නේ,
  - නයිට්ස්
  - වලාකුළු
  - මණ්ඩුකයෝ

මේ අනුව අපට පැහැදිලි වන්නේ ග්‍රීක යුගයේ දී උසස් භාෂාවක් හා සාහිත්‍යයක් පැවැති බව යි.

අන්තර්ගතය :- එච්.ජී.අයි.කුමාරි මිය,කලාප අධ්‍යාපන කාර්යාලය,දෙනුවර,පිළිමතලාව.
පරීක්ෂා කිරීම :- කේ.ඒ. ඩී නිමල් මයා, ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය, කොළඹ 14.
සැකසුම :- ටී.එම්.මොරගොඩ මයා, ජාතික තරුණ සේවා සභාව (2017-2018)

Copyright © www.e-thaksalawa.moe.gov.lk